# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1799/12 – 2013 පෙබරවාරි 28 වැනි බ්‍රහස්පතින්දා – 2013.02.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2013 අංක 62 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4/3/4/2012/ඩී/297
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: 4/1/5/18.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2013 පෙබරවාරි මස 27 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
1200/6, 'මිහිකත මැදුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– ප්‍රාදේශීය ලේකම්, කුරුණෑගල.

2. **ඉඩමේ විස්තරය.**– වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තිරගන්දහයේ බටහිර කෝරළේ සුළු කොට්ඨාසයේ, හෙරලියාවල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද කේයූ/කේආර්එන්/2013/003 හා 2013.02.05 දිනැති ප්‍රගමන අනුරේඛනයේ මුළු ප්‍රමාණයෙන් හෙක්. 10.1175 ක් පමණ වූ පහත සඳහන් නම් වලින් හා ප්‍රමාණවලින් යුත් ඉඩම් කැබලි දෙක (02) ට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – හෙරලියාවල වත්ත – ප්‍රමාණය: හෙක්. 2.7366**
උතුරට: ප්‍රාදේශීය සභා මාර්ගය, මාර්ගය (මා.සං.අ.) සහ මාර්ගය; නැගෙනහිරට සහ දකුණට: මාර්ගය; බටහිරට: හෙරලියාවල වත්ත.

02. **කැබලි අක්ෂර 'බී' – හෙරලියාවල වත්ත – ප්‍රමාණය: හෙක්. 7.3809**
උතුරට: මාර්ග (මා.සං.අ.); නැගෙනහිරට: මාර්ගය (මා.සං.අ.) සහ ඇසල්රෝ වත්ත; දකුණට: ඇසල්රෝ වත්ත; බටහිරට: මාර්ගය.

03 – 634